# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2359/62 – 2023 නොවැම්බර් මස 25 වැනි සෙනසුරාදා – 2023.11.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/15/05/2013.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2017.07.27 දිනැති හා අංක 2029/31 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2017.07.24 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 07, විජේරාම මාවත, අංක 120/5, ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය, නියෝජ්‍ය අධ්‍යක්ෂ කළමනාකරණ සංවර්ධන ජේ.එල්.පී. ප්‍රනාන්දු මයා සහ කොළඹ 07, විජේරාම මාවත, අංක 120/5 හි පිහිටි ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 27/2017 හා 2023.10.23 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 නොවැම්බර් මස 14 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම් කිරීමේ අංශය සහ කාර්මික අධිකරණයේ දී ය

නඩු අංකය : A/27/2017.
ආරාවුල් අංකය : IR/15/05/2013.

ජේ.එල්.පී. ප්‍රනාන්දු මයා,
නියෝජ්‍ය අධ්‍යක්ෂ කළමනාකරණ සංවර්ධන,
ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය,
නො. 120/5, විජේරාම මාවත,
කොළඹ 07.

පළමු පාර්ශවය

එරෙහිව

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය,
නො. 120/5, විජේරාම මාවත,
කොළඹ 07.

දෙවන පාර්ශවය

ප්‍රදානය

කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍ය ගරු වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ආර්.එස්.ආරියප්පෙරුම වන මා පත්කර මා වෙත මෙයින් යොමු කර ඇත.

එකී යොමු කිරීමට අනුව පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී ඇත්තේ,

''ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ 2005.07.15 දින සිට නියෝජ්‍ය අධ්‍යක්ෂක කළමනාකරන සංවර්ධන ලෙස සේවය කරන ජේ.එල්.පී. ප්‍රනාන්දු මහතාට අංශ ප්‍රධානි කළමනාකරන සංවර්ධන තනතුර ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුවී ඇත්ද යන්න හා එලෙස අසාධාරණයක් සිදුවී ඇත්නම් ඔහුට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳ වේ.''

දෙපාර්ශ්වය පළමු සහ දෙවන ප්‍රකාශ ඉදිරිපත් කළ පසු 2018.01.09 දින දෙපාර්ශ්වයේ නීතිඥ මහතුන් සහ ඉල්ලුම්කාර හා වගඋත්තරකාර ආයතනයේ නියෝජිතයන්ද පෙනී සිටිමින් ආයතනය භාරයේ ඇති ලේඛන ඉල්ලුම්කාර පාර්ශ්වය ඉල්ලා සිටීම නිසා ඒවා ලබාදෙන තෙක් වෙනත් දිනයකට නඩුව කල් තබන ලදී. දිව්රුම් පෙත්සම් වගඋත්තරකරුට නොලැබුන බව දැන්වීම නිසා 2018.05.28 දින කැඳවූ අවස්ථාවේදී වගඋත්තරකාර පාර්ශ්වයේ නීතිඥ මහතා කියා සිටියේ, ''2018.04.26 දිනැති ලිපිය මගින් නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ සහකාර ලේකම් දන්වා ඇත්තේ 2018.04.04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි අදාළ කමිටුව විසින් දී ඇති නිර්දේශයන් ආයතනයට අදාළ වන සේ ක්‍රියාත්මක කර ඒ පිළිබඳ වාර්තාව අදාළ අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලෙසයි. අදාළ දැනුම් දීම සහ ඊට අමාත්‍යාංශයේ ඇති ලේඛන අනුව වර්ෂ 2015.07.15 වන දින සිට ඉල්ලුම්කාර සේවක මහතාට අධ්‍යක්ෂක තනතුරට පත්වීම හෝ තනතුරට පුරප්පාඩු නොමැති නම් අධිසේවක පදනම මත පත්වීමක් ලබාදෙන ලෙසයි.'' මේ පිළිබඳව 2018.05.10 දින පාලක සභා රැස්වීමේදී ගන්නා තීරණයෙන් පසු සමථයක් ඇතිවිය හැකි බැවින් ඒ සඳහා 2018.07.13 දින කැඳවීමට දෙපාර්ශ්වයම එකඟවිය. නැවත 2018.07.13 කැඳවූ විට වගඋත්තරකාර ආයතනයේ පාලක සභාව 2018.07.02 දිනැති ලිපිය පරිදි කටයුතු කිරීමට කටයුතු කරන බවය. එහෙත් ඉල්ලුම්කරු කියා සිටින්නේ පසුගිය නඩු වාරයේ (2018.05.28) අමාත්‍ය මණ්ඩල තීරණය ''2015.07.15 දින පැවති පාලක සභා රැස්වීමේ අදාළ නිර්දේශ අනුව කටයුතු කරන ලෙසට එකී පාලක සභාව තීරණයකට එළඹ ඇති බවයි'' නමුත් ඉදිරිපත් කරන ලද ලේඛනය (2018.07.02) කැබිනට් තීරණයට පටහැනි බවත් 2015.07.15 දින සිට තනතුර ක්‍රියාත්මක විය යුතුය යන්න 2018 ජනවාරි 01 ලෙසට සඳහන්ව ඇති බවයි. ඒ අනුව අමාත්‍යාංශය එවූ ලේඛන සහ එයට දෙන ලද පිළිතුරු ගරු බේරුම්කරණයට සැපයීමට වගඋත්තරකරු

එකඟව 2018.10.09 දිනට කල් තබන ලදී. අදාළ ලේඛන ලබාදීමට අපහසුතාවය මත නැවත 2018.11.26 දිනට කල් තබන ලදී.

නඩු විභාග සඳහා ගන්නා කාලය අඩු කරන ලෙස දෙන ලද උපදෙස් අනුව පැමිණිලිකරුගෙන් ලබාගත් දිව්රුම් පෙත්සම් අනුව 2018.11.26 දින නඩු විභාගයේ හරස් ප්‍රශ්න ඇසීමේදී තමුන් ඉල්ලන සහන මොනවා දැයි ඉල්ලුම්කරුගෙන් ඇසූ විට ඉල්ලුම්කරු කියා සිටියේ ''ආයතන ප්‍රතිව්‍යුහගත කිරීමේදී මා හටවූ අසාධාරණ ලෙස තනතුර පෞද්ගලික වන සේ තැබීම එම හබය පිළිබඳවය. '' ඊට පසු මට හිමිව තිබූ අධ්‍යක්ෂ තනතුරත් මගේ දේශන ගාස්තු අසාධාරණය ලෙස කපා හැරීම පිළිබඳව, වැටුප් වර්ධක නොගෙවීම සම්බන්ධ සහන ඉල්ලා සිටියත් එය ලබාදීමට කටයුතු නොකරන ලදී.

වගඋත්තරකාර පාර්ශ්වයේ නීතිඥ මහතා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව ගැන ජාතික වැටුප් කොමිසම ගැන දිගින් දිගටම ප්‍රශ්න කලත් නිපුණතා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්ගේ 2018.04.26 ලිපියේ ''කමිටු නිර්දේශයන්හි අධ්‍යක්ෂක මණ්ඩල තීරණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩ පිළිවෙලහි නැවත සලකා බැලීමේ හැකියාවක් තිබූ නමුත් මෙම නිලධාරියාගේ ඉල්ලීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යවන ලද එම ඉල්ලීම් ලිපියේ තිබී නැත. කෙසේ වුවද මේ පිළිබඳ කළමනාකරන සේවා දෙපාර්තමේන්තුව විසින් නැවත අධ්‍යනය කොට තීරණයක් ගැනීම සුදුසු බව නිර්දේශකර ඇත.'' පෙරකමිටු නිර්දේශ වලට අමතරව නව කමිටු නිර්දේශයේ ඇත්තේ '' මොහු දේශපාලන පළිගැනීම් වලට ලක්වීම නිසා නියමිත කාලවලදී උසස්වීම් ලැබී නැති බව නිරීක්ෂණය වන හෙයින් හා 2015.07.15 වන විට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බැවින් 2015.07.15 දින සිට අධ්‍යක්ෂක තනතුරට පත්කිරීමට නිර්දේශ කරමු. තනතුරු පුරප්පාඩු නොමැති නම් අධිසේවක පදනම මත පත්වීම ලබාදීමට නිර්දේශ කරමු'' යනුවෙන් සඳහන් 2018.04.04 කැබිනට් මණඩල තීරණය 2018.04.05 වන දින ඇමුණුම් සහිතව නිපුණතා සංවර්ධන හා පුහුණු අමාත්‍යාංශයේ ලේකම් වෙත එවා ඇත.

මේ පිළිබඳව කම්කරු දෙපාර්තමේන්තුව කාර්මික සබඳතා අංශයේ පවත්වන ලද පරීක්ෂණයන්හිදී 2015.12.09 වන දින වැඩ බලන සහකාර කම්කරු කොමසාරිස් (කාර්මික සබඳතා) වෙත යොමු කළ ලිපිය මගින් අදාළ ආයතනයේ පරිපාලන නිලධාරි ඉල්ලුම්කරුට අසාධාරණයක් නොවූ බැව් පවසා පිළිතුරු ලිපියක් එවා ඇත. ''තනතුරු හා වැටුප් ප්‍රතිව්‍යුහගත කිරීමේදී ඔහුට අසාධාරණයක් වී ඇද්ද යන්න පරීක්ෂා කිරීම සඳහා පෙර බඳවා ගැනීමේ පටිපාටියේ ඇති තනතුරු ඇතුලත් පෙර බඳවා ගැනීමේ පටිපාටියට අනුව අන්තර්ග්‍රහනය කළ ආකාරය පරීක්ෂා කිරීම සඳහා, පෙර බඳවා ගැනීමේ පටිපාටිය පරීක්ෂා කළ යුතු බැවින් 2015.12.09 වන දින පෙරවරු 11.30ට එම පෙර බඳවා ගැනීමේ පටිපාටිය මෙම කාර්යාලයට ඉදිරිපත් කරන්න'' යන (පැ.28) ලෙස සටහන් කර ඇති වැඩ බලන සහකාර කම්කරු කොමසාරිස් වයි.ඒ.බී.එස්.යහලවෙල මහත්මිය විසින් වගඋත්තරකරුට යවන ලද 2015.12.02 දිනැති ලිපියට පිළිතුරු ලෙස ඉල්ලුම්කරුට අසාධාරණයක් නොවූ බව සඳහන් කරන ලද ලිපියක් 2015.12.09 දින එවා ඇත.

එම පිළිතුරු ලිපියේ හතරවන ඡේදය අග ''අනතුරුව ප්‍රතිව්‍යුහගත තනතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරගෙන ඇත.'' සමස්ථ නඩුවේ විත්තිය විසින් විභාගයේදී ඉදිරිපත් කළ සාකච්ඡා හා ලේඛන අනුව මානව සම්පත් හා පරිපාලන අංශය විසින් ද්වේෂ සහගතව කටයුතු කර ඇති බව පෙනී යයි. අදාළ ලේඛන එම අංශයෙන් ඉල්ලුම්කරුට ඉදිරිපත් කර නැත. නඩු ගොනුවට නඩුවට අදාළ වන ලේඛන වරින්වර ගෙන්වා ගැනීමටද සිදුව ඇති අතර දැනටමත් සමහර ලේඛන හිතාමතාම ගොනුකර නැති බව ගොනුව පරීක්ෂා කිරීමේදී පෙනේ. උදාහරණ :- කැබිනට් මණ්ඩල තීරණය වැනි වැදගත් ලේඛන නිසි වේලාවේදී ගෙන්වා ගැනීමට නොහැකි විය, 2016.06.10 දිනැති පැ. 19 ලෙස ලකුණු කරන ලද සහකාර කම්කරු කොමසාරිස් වාර්තාවේ නිර්දේශ වී ඇත්තේ ''පැමිණිලිකරුට උසස්වීම් ලබා නොදීම මගින් ඔහුට අගතියක් සිදුවී ඇති බව හැඟෙන බැවින් කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ බේරුම්කරණයට යොමු කිරීම සුදුසු යැයි වාර්තා කර ඇත. යහලවෙල මහත්මිය සාක්ෂි දෙමින් ඇයට වඩා පහළ නිලධාරියෙකුගේ එනම් කම්කරු නිලධාරි ශාන්ත කුමාර මහතා දෙන ලද නිර්දේශ ගැන දිගින් දිගට වගඋත්තරකාර පාර්ශ්වයෙන් ප්‍රශ්න කරන ලදී. 2014.08.16 දින දෙන ලද නිර්දේශ ගැන ප්‍රශ්න කරන්නේ එම නිලධාරියාට වඩා ජ්‍යෙෂ්ඨ නිලධාරිනිය 2016.06.10 දෙන ලද නිර්දේශකයක් තිබියදීය. මෙම නඩු විභාගයේදී ඊ.එස්.ජී.රොද්‍රිගෝ මහතාගේ උපදෙස් මත හිතාමතා අනවශ්‍ය ලෙස ප්‍රශ්න කිරීම නිසා ඉල්ලුම්කරුගේ සේවා කාලය අවසන් වීමෙනුත් පසුව නඩුව ගෙනයාමට සිදුවිය'' මෙම ප්‍රමාදවීමේ ගැටලුවට පරිපාලන නිලධාරි ඊ.එස්.පී.රොද්‍රිගෝ මහතාට පූර්ණ ලෙස වගකීම පැවරිය යුතුය. ඔහු නඩු විභාගය පවත්වන ලද දිනයන්හීදී සහභාගී වූ අතර සාක්ෂි දීමට ඉදිරිපත් නොවන ලදී.

යහලෙවල මහත්මිය තවදුරටත් සාක්ෂි දෙමින් මැද කොළඹ කාර්යාලයේදී හා කාර්මික සබඳතා අංශයේ ශාන්ත කුමාර මහතා යටතේත් පරීක්ෂණ කර තිබූ නිසා ''සියලු තොරතුරු ලිපිගොනුව අධ්‍යනය කිරීමේදී ලබාගෙන ඇති බව පැහැදිලි වූ බවත් එම නිසා පැමිණිලිකරු සමඟ සාකච්ඡා කළේ නැහැ. වගඋත්තරකරුගෙන්ද තොරතුරු ලබාගත්තා. දෙපාර්ශ්වය ගෙන්වීමේ අවශ්‍යතාවයක් තිබුනේ නැති බවයි. එමෙන්ම ඇයගේ සාක්ෂියේදී වගඋත්තරකාර ආයතනයට දුරකථනයෙන් මේ සම්බන්ධව කථා කළ විට සඳහන් කළේ ''අපි සෑහෙන අවස්ථාවල ආවා ඒ නිසා මේකට දෙන්න තිබෙන සියලු ලේඛන ලබාදී තිබෙනවා. ඒ නිසා නියෝගය ලබා දෙන්න කියා තමයි ඉල්ලීම් කළේ මගේ නිගමනය මට ලබා දෙන්න බෑ, ඒ නිසා තමයි බේරුම්කරණයට යොමුකළේ'' යැයි ඇය 2022.04.08 සාක්ෂි දෙමින් කියා ඇත. තවදුරටත් ''ඊ.එස්.පී.රොද්‍රිගෝ කියන මහතා ලිපියක් දී තියනවා. ජේ.එල්.පී. ප්‍රනාන්දු මහතා සමඟ කාර්මික ආරාවුලක් නොමැති බැවින් සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන ආයතනය දැනුවත් කරන්න කියා.'' සාක්ෂිකාරිය තවදුරටත් සාක්ෂි දෙමින් කම්කරු කොමසාරිස්තුමා මට කිව්වා මේ සම්බන්ධයෙන් සියලු තොරතුරු ලබාගෙන තිබෙන්නේ, දෙපාර්ශ්වය කැඳවලා ගන්න තරම් තොරතුරක් නෑ හැම තොරතුරක්ම කියන්න පැමිණිලිකරුට අසාධාරණයක් සිදුවෙලා ඇත්ද කියලා පරීක්ෂා කරන්න කියලා මට ගොනුව දුන්නා. අසාධාරණයක් සිදුවී ඇද්ද යන්න සලකා බැලීම සඳහා පැමිණිලිකරුව කැඳෙව්වේ කියා.'' එම ඉල්ලුම්කරුගේ ලබාගත් තොරතුරු

වාර්තාව පිටු 32කින් යුතුව ඇත. එය පැ. 27 ලෙස ලකුණු කර ඇත. (පැ.28) ලේඛනය මගින් ''පෙරවරු 11.30ට ඉදිරිපත් කරන්න කියා දැන්වූයේ පරීක්ෂණයට සහභාගී වෙලා කරුණු දක්වන්න කියන නිසයි. වේලාව වෙන් කරන්නේ එසේ නැතිනම් ලේඛන කාර්යාලයට භාරදෙන්න කියලා ලිපියක් යවනවා.''

ඒ අනුව ජේ.එල්.පී. ප්‍රනාන්දු මහතාට උසස්වීම් අවස්ථාව ලබානොදීමේ චේතනාවෙන් කටයුතු කර ඇති බව පෙන්වා දිය හැක්කේ අංශ දෙකක් එක් කිරීම, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල්ගේ 2010.05.07 ලිපියෙන් නව බඳවාගැනීම් නොකරන ලෙස දන්වා තිබියදී හා 2012.02.14 ඉල්ලුම්පත් කැඳවා (දිවිරුම් පෙත්සමේ ඇ.4) නව බඳවා ගැනීමක් කර ඇත. එහෙත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කර ඇත්තේ 2013.02.20 වන දිනය.

තවදුරටත් සහකාර කම්කරු කොමසාරිස්වරිය දෙන ලද සාක්ෂි හා ලේඛන ඉදිරිපත් කිරීම් හා සොයාබැලීම් කර ඉල්ලුම්කරුට හෝ විත්තිකාර පාර්ශ්වයට අසාධාරණයක් කර නැත. එමෙන්ම වගඋත්තරකාර පාර්ශ්වය ඉදිරිපත් කරන ලද ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය මෙම නඩුවට අදාළ අණපණත් නොවන (පාරිතෝෂිත ගෙවීමේ පණතට අදාළව) මීට සමාන නොවන නඩුවකදී දෙන ලද නියෝගයක් වන අතර එය මෙම නඩුවට අදාළ කරගත හැකි නොවේ. කාර්මික ආරාවුල් පනතේ 17 වගන්තියේ (1 හා 2) අනුව බේරුම්කරුවකුට අවශ්‍ය විභාග පැවැත්වීම, හා සාක්ෂි කැඳවීම කළ හැකිය.

නඩුව ආරම්භයේදීම නිපුණතා හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ සහකාර ලේකම්ගේ 2018.04.26 දිනැති ලිපියේ 2018.04.04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කටයුතු කර නැති බැවින් අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක කර ඒ බැව් නැවත අමාත්‍යාංශයට දන්වන ලෙස එවා ඇති ලිපියේ පිටපත ඉල්ලුම්කරුට ලබාදෙන ලෙස බේරුම්කරණය මගින් දැන්වූ අතර මෙම දිනයන්හිදී (2018.05.10, 2018.07.13, 2018.11.26) දින අයැද සිටි නමුත් එම ලිපිය ඉල්ලුම්කරුට ලබාදීමට අපොහොසත් වී ඇත. නඩු කටයුතු පමා නොකරන මෙන් අමාත්‍යවරයා දෙන ලද උපදෙස් හේතුකොටගෙන පෙත්සම්කරු ඉදිරිපත් කර ඇති දිවිරුම් පෙත්සමේ සාක්ෂි කැඳවීමට සිදුවීම නිසා මෙම නඩුව ආරම්භයේදීම තීරණයක් ලබාදීමට තිබූ හැකියාව මඟ හැරුණි. යහලෙවෙල මහත්මියගේ වාර්තාව පරීක්ෂා කිරීමෙන් නිරීක්ෂණය වන්නේ කැබිනට් මණ්ඩලයේ තීරණය හා අදාළ ලේඛන කාර්මික සබඳතා අංශයේ පරීක්ෂණයේදීද ඉදිරිපත් කර නොතිබූ බවයි. එම ලේඛන ඉදිරිපත් කර තිබුණේ නම් කාර්මික ආරාවුල් පනත යටතේ බේරුම්කරණයට යොමු නොකරම කාර්මික සබඳතා අංශය මගින්ම තීරණයක් ගනු ඇත. නඩුව අවසානයේ ගෙවිය යුතු මුදල් පිළිබඳ තීරණයක් ගැනීමේ අපහසුතාවය මත 2023.07.07 වන දින සහකාර කම්කරු කොමසාරිස්තුමිය මගින් තැපැල් මගින් සහ විද්‍යුත් තැපැල ඔස්සේ ඉල්ලුම්කරු විසින් ඉල්ලා ඇති මුදල නිවැරදි දැයි අසා යැවූ ලිපියට 2023.08.15 දින එවා ඇති පිළිතුර එකී යවන ලද ලිපියට අදාළ නොවේ. සෘජු පිළිතුරක් දී නොමැත.

ඉහත සඳහන් සාක්ෂි, ලේඛන සහ විශේෂයෙන් කැබිනට් තීරණ අනුව ඉල්ලුම්කරුට උසස්වීම් දීමට හැකිව තිබූ බව තීරණය කරමි. එම නිසා ඉල්ලුම්කරුට 2013.02.20 දින සිට අංශ ප්‍රධානි තනතුරට හා 2015.07.15 දින සිට අධ්‍යක්ෂ තනතුරේ පිහිටුවා එම තනතුරුවලට අදාළ හිඟ වැටුප් හා දීමනා ලෙස රුපියල් 9,261,444.00 (අනූ දෙලක්ෂ හැට එක්දහස් හාරසිය හතලිස් හතර)ක මුදල මැද කොළඹ කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත මෙය ගැසට් ගත කිරීමෙන් මසක් ඇතුළත තැන්පත් කරන ලෙස වගඋත්තරකරුට නියම කරමි.

මෙම තීරණය සාධාරණ සහ යුක්ති සහගත ප්‍රදානයක් බව සහතික කරමි.

ආර්.එස්. ආරියප්පෙරුම,
බේරුම්කරු.

2023 ඔක්තෝබර් මස 23 වැනි දින දී ය.

EOG 11 - 0293

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.